# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 42 — 1973 ජනවාරි 12 වැනි සිකුරාද — 1973.01.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සනත් ... ... | (අතිරේක) | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — |
| ශ්‍රී ලංකා ඇපල් මහාධිකරණයේ දැන්වීම ... ... | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම ... ... | 5 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | 6 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... | — | විවිධ දැන්වීම ... ... ... ... | — |


සැළකිය යුතුයි—මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 ජනවාරි 5 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### බස්නාහිර පළාත

**කළුතර දිස්ත්‍රික් උසාවි නඩුශාලාවේදීය**

පොතුවිල පදිංචි ආරියවංශ ගනනාථ වෙත්තසිංහ......................
..............................................පැමිණිලිකාරයා.

නොම්මරය පී. 2804 එදිරිව

1. පොතුවිල පදිංචි පේමලතා වෙත්තසිංහ සහ 2. පද්මිනී වෙත්තසිංහ ........................ ............... විත්තිකාරියෝ.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ 1 වෙනි සහ 2 වෙනි විත්තිකාරියන්ට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1973 ක් වූ ජනවාරි මස 26 දින පෙරවරු 10 ට ඉඩම් පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

මෙම ඉඩම් වෙන්දේසි කරනු ලබන්නේ ඇස්තමේන්තු ගාස්තුව වන රු. 10,000 ක්ද, පවුන්ඩේජ්, පිස්කල් ගාසට් සහ ඉඩම් නඟානම් කිරීමේ ගාස්තුද අයකර ගැනීම සඳහාය.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මහ පයියාගල පිහිටි දෙල්ගහවත්ත නොහොත් මහගෙදරවත්ත නැමැති ඉඩමට 1971 ජූනි මස 23 වෙනි දින අංක 624 දරණ ඩී. ඒ. සෙන්ට් බීඩ් සමරසිංහ මිනින්දෝරු මහතාගේ ප්ලෑනයේ ප්‍රකාර ලොට් 1 සහ 2 දරණ කට්ටිවලට උතුරට පාරද, නැගෙනහිරට මෙම ඉඩමේම ප්ලෑන් අංක 208 ඒ ප්ලෑනේ ලොට් 4 සහ 1ද, දකුණට ගොඩපරගහවත්ත සහ බස්නාහිරට හීරළුකන්දවත්ත සහ පාරද යන මායිම් තුල ප්‍රමාණය අක්කර තුනයි රූඩ් එකයි පර්චස් විසි තුනක් විශාල ඉඩමේ විත්තිකරුවන්ගේ සියළුම අයිතිවාසිකම් වේ. (අ. 3, රූ. 1, ප. 23.).

එච්. ඞී. සිල්වා,
කළුතර අතිරේක නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1972 නොවැම්බර් මස 24 වෙනි දින,
කළුතර නියෝජ්‍ය පිස්කල් කන්තෝරුවේදීය.

1-530

---

### දකුණු පළාත

**ගාල්ලේ දිස්ත්‍රික් නඩුශාලාවේදීය.**

හබරාදූව පදිංචි, ලීලාවතී උර්සිනා ගුණසේකර (විවාහයට පෙර) අබේවික්‍රම ගුණසේකර සහ තවත් අය...............පැමිණිකාරයෝ.

නොම්මරය ඇල්. ඇන්. 6417 එදිරිව

හබරදූව පදිංචි, එඩී ඩයස් අබේවික්‍රම ගුණසේකර......විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1973 ක් වූ පෙබරවාරි මස 14 වැනි බදාදා පෙරවරු 10.30 සිට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

රුපියල් 2960 ක් සහ 1965.4.1 දින සිට මසකට රු. 40 බැගින් අලාභය සහ ඇස්තමේන්තු ගාස්තු රු. 44.12½ ක් අයකරගැනීම සඳහා වේ.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන්** නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු **එවනු ලැබේ.** කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් බාරගනු නොලැබේ.

**1970 ජූනි මස 2 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති**

### උපලේඛනය

1. දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ සබරාදූව ගමේ පිහිටි උතුරෙන් අඹගහ අද්දර කුඹුර සහ රදා කුඹුරද, නැගෙනහිරට: පින් අද්දර කුඹුර සහ රදා කුඹුරද, දකුණෙන් කැකුලමද බස්නාහිරින් එරදූගොඩ වත්තද යන මෙකී මායිම් තුල වී කුරිනි විස්සක් ප්‍රමාණ පොතු ලියැද්ද නමැති කුඹුරෙන් නොබෙදූ 1/10 පංගුවක් සහ ඔහුට හිමි සියළු අයිතිවාසිකම් ද වේ.

2. එම ගම පිහිටි හේවාගෙවත්ත නමැති ඉඩමට මායිම්: උතුරට: වැලිපොත සහ පුංචි බෙලිගහවත්තද, නැගෙනහිරට: බෙලිගහවත්තද, දකුණට: කැපූඇලේ වත්තද, බස්නාහිරට: කොහොඹගහවත්ත හෙවත් එගොඩවත්ත යන මෙකී මායිම් තුළ අක්කර 1½ ක් පමණ ඉඩමෙන් නොබෙදූ 1/70+1/350 පංගුවද ඔහුට හිමි සියළු අයිතිවාසිකම්ද වේ.

3. එම ගම පිහිටි පරණගෙදර වත්තට මායිම්: උතුරට: හික්ගහ වත්ත සහ වල්ගමවත්තද, නැගෙනහිරට: පුංචි මැදිල්ලවත්තද, දකුණට: මැඩිල්ලෙවත්තද, බස්නාහිරට: උඩගෙදරවත්තද යන මෙකී මායිම තුළ අක්කර එකක ප්‍රමාණ ඉඩමෙන් නොබෙදූ 1/70+1/350 පංගුවද ඔහුට හිමි සියළුම අයිතිවාසිකම්ද වේ.

4. එමගම පිහිටි වලකඩකුඹුර හෙවත් උන්ඩියෙ කුඹුරට මායිම්: උතුරට පිල්ලේ කුඹුරද, නැගෙනහිරට: ආණ්ඩුවේ ඉඩමද, දකුණට: කුරුන්දද, බස්නාහිරට: වලකඩවත්තද යන මෙකී මායිම් තුළ වී කුරිනි විස්සක් ප්‍රමාණ කුඹුරෙන් නොබෙදූ 1/70+1/350 පංගුවද ඔහුට හිමි සියලු අයිතිවාසිකම්ද වේ.

5. එම ගමේ පිහිටි ඉඳිමරුවවත්ත හෙවත් පනත්දූවෙවත්තට මායිම්: උතුරට සහ නැගෙනහිරට පොල්කඳ, දකුණට: රත්ගමයා වත්ත සහ හුණුමුල්ලේ වත්තද, බස්නාහිරට: සපුගහවත්තද යන මෙකී මායිම් තුල අක්කර දෙකක් ප්‍රමාණ ඉඩමෙන් නොබෙදූ 1/70+1/350 පංගුවද එහි තිබෙන අන්ද්‍රිස් අබේවික්‍රම ගුණසේකර විසින් වවන ලද රබර් වැවිල්ලෙන් 1/5 පංගුවද ඔහුට හිමි සියළුම අයිතිවාසිකම්ද වේ.

6. එම ගම පිහිටි හබරාදූව විල අද්දරවිල සහ නායිදූව සහ පුංචිදූව නමැති ඒකාබද්ධ ඉඩම් වලට මායිම්: උතුරට සෙක්කන්ගෙවිලද නයිදූවේ කැබැල්ලක් සහ අඹූඇලද, නැගෙනහිරට: සේක්කන්ගෙ විලද, රාජසන්තක විලද, දකුණට සහ බස්නාහිරට: සුල්තාන් බාවගේ විලද යන මෙකී මායිම් තුල වී බුසල් දහඅටක් ප්‍රමාණ කුඹුරෙන් නොබෙදූ 1/140+1/350 සහ ඔහුට හිමි සියළුම අයිතිවාසිකම්ද වේ.

7. එම ගම පිහිටි පින්අද්දර නමැති ඉඩමට මායිම්: උතුරට කල්දරයා කුඹුර, නැගෙනහිරට: වික්‍රමවත්ත, දකුණට: රදාකුඹුර බස්නාහිරට: පොතුලියැද්ද යන මෙකී මායිම් තුල වී බුසල් දෙකක් ප්‍රමාණ කුඹුරෙන් නොබෙදූ 1/140+1/350 පංගුවද ඔහුට හිමි සියළුම අයිතිවාසිකම්ද වේ.

8. එම ගම පිහිටි අද්දරපතිරණ වත්තේ අංක 1 දරණ කැබැල්ලට මායිම්: උතුරට: එම ඉඩමේ ලොට් 3, 4, 5, 6 සහ 7 දරණ කැබලිද, නැගෙනහිරට: ගල්වක්කඩඇලද කෝන්ගහ පිට්ටනිය සහ අද්දර පතිරණ ඔවිටද, දකුණට: අද්දර පතිරණ ඔවිට සහ බස්නාහිරට: ගොඩපතිරණ වත්තද යන මෙකී මායිම් තුල රූඩ් 2, පර්චස් 34.75 ප්‍රමාණ ඉඩමෙන් නොබෙදූ 1/140+1/350 පංගුවද ඔහුට හිමි සියළුම අයිතිවාසිකම්ද.

9. එමගම පිහිටි දෙනිය හෙවත් දෙනිය කියන මත්තේ බෙදා වෙන්කල ලොට් 7 දරණ කැබැල්ලට මායිම්: උතුරට: ලොට් නො 8 දරණ එම ඉඩමේ කැබැල්ලද, නැගෙනහිරට: එම ඉඩමේ ලොට් 17 දරණ කැබැල්ලද දකුණට: එම ඉඩමේ ලොට් 6 දරණ කැබැල්ලද, බස්නාහිරට: මහපාරද යන මෙකී මායිම් තුල පර්චස් 13.74 ප්‍රමාණ ඉඩමෙන් නොබෙදූ 1/2 පංගුවක් සහ ඔහුට අයිති සියළුම හිමිකම්ද වේ.

10. එම ගම පිහිටි කෝන්ගහවත්තේ බෙදා වෙන්කරන ලද ලොට් 16 දරණ ඉඩමට මායිම්: උතුරට: එම ඉඩමේ ලොට් 17 දරණ කැබැල්ලද, නැගෙනහිරට: කරත්ත පාරද, දකුණට: ලොට් 15 දරණ එම ඉඩමේ කැබැල්ලද, බස්නාහිරට: මෙම ඉඩමේ ලොට් 2 සහ 3 දරණ කැබලිද යන මෙකී මායිම් තුල පර්චස් 7.3 ප්‍රමාණ ඉඩමෙන් නොබෙදූ 1/2 පංගුව සහ ඔහුට අයිති සියළුම හිමිකම්ද වේ.

11. එම ගම පිහිටි බෙලිගහවත්තේ මැද කැබැල්ල නමැති ඉඩමට මායිම්: උතුරට: එම ඉඩමේ තවත් කැබැල්ලක්, නැගෙනහිරට: පැල වත්ත. දකුණට: කොට්ටම්බ ගහවත්තේ කැබැල්ලක්, බස්නාහිරට: හේවාගෙ වත්ත යන මෙකී මායිම් තුල අක්කර එකක් පමණ විශාල ඉඩමෙන් නොබෙදූ 1/16 න් 1/35 න් 1/2 පංගුව සහ 1/16 පංගුවෙන් 1/140 පංගුවද ඔහුට අයිති සියළුම අයිතිවාසිකම්ද වේ.

12. එම ගම පිහිටි බෝදරගම කුඹුරේ නොම්මර 18 දරණ කැබැල්ලට මායිම්: උතුරට: අඩිපාරට ඇරපු ලොට් 19 කැබැල්ලද, නැගෙනහිරට: ලොට් 17 ද, දකුණට: දෙල්ගහඅද්දර කුඹුර, බස්නාහිරට: බෝදරගම පන්සලේ වත්තද යන මෙකී මායිම් තුල පර්චස් 26.41 ප්‍රමාණ කුඹුරෙන් 1/2 පංගුවද ඔහුට හිමි සියළුම අයිතිකම්ද වේ.

13. එම ගම පිහිටි ඔබදෙනිය අංක 4 දරණ කැබැල්ලට මායිම්: උතුරට: ඇල, නැගෙනහිරට: මෙම ඉඩමේ අංක 5 දරණ කැබැල්ලද දකුණට: අඩිපාරද, බස්නාහිරට: මෙම ඉඩමේ ලොට් 3 දරණ කැබැල්ලද යන මෙකී මායිම් තුල පර්චස් 21.64 ප්‍රමාණ ඉඩමෙන් 1/2 පංගුව සහ ඔහුට හිමි සියලුම අයිතිවාසිකම්ද වේ.

14. එම ගම පිහිටි ඇල අද්දර වත්ත නමැති ඉඩමට මායිම්: උතුරට: බක්මීගහවත්ත, නැගෙනහිරට: පැලවත්ත, දකුණට: බෙලිගහවත්ත, බස්නාහිරට: බෙලිගහවත්ත සහ බක්මීගහවත්ත යන මෙකී මායිම් තුල අක්කර එකක් පමණ ඉඩමෙන් 6/20 සහ පතිරණ වඩුම බැප්ටිස් අප්පුහාමි විසින් වවන ලද කොස්ගස් අවද ඔහුට හිමි සියළු අයිතිවාසිකම්ද වේ.

ඇෆ්. පී. ගුණපාල,
දි. ප. පිස්කල් වෙනුවට.

1972 දෙසැම්බර් මස 6 වැනි දින,
ගාල්ලේ පිස්කල් කන්තෝරුවේ දී ය.
1-531

---

## මුදල් නඩු පිළිබඳ දැන්වීම්

**නයිසයි ආඥාවයි**

**ගම්පොල පැවැත්වෙන මහනුවර දිස්ත්‍රික් උසාවියේ දිය**

අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගිය මහනුවර ගිරුස්සගල පාරේ පදිංචිව සිටි හේරත් බණ්ඩා කිරිමැටියාවගේ මුදලය සම්බන්ධවයි.

මියගිය තැනැත්තා මහනුවර ගිරුස්සගල පාරේ පදිංචි මන්ත්‍රී කුමාරි කිරිමැටියාව .................................... පෙත්සම්කාරිය.
මුදල් නඩු අංකය: ටී/257 එදිරිව

මහනුවර ගිරුස්සගල පාරේ පදිංචි (1) හේමමාලී පෙරේරා මහත් මිය කලින් හේමමාලී කිරිමැටියාව. (2) සුනේත්‍රා කිරිමැටියාව. (3) අනුර බණ්ඩා කිරිමැටියාව. (4) මෙහි 3 වෙනි වගඋත්තරකරු තමා වෙනුවෙන් මෙම නඩුවේ භාරකරු හැටියට උදය බණ්ඩා කිරිමැටියාව .............................. වගඋත්තරකරුවෝ.

පෙත්සම්කාරිය වෙනුවෙන් පෙනී සිටින පී. බී. ගුණතිලක නීතිඥ මහතා සිටියදී මේ කාරණය තීරණයක් කිරීම පිණිස 1972 ක්වූ ඔක්තෝබර් මස 25 වෙනි දින ගම්පොල පැවැත්වෙන මහනුවර දිස්ත්‍රික් උසාවියේ අතිරේක දිසා විනිසුරු තැන්පත් ආර්. එල්. ද සිල්වා මැතිතුමාණන් ඉදිරියට පැමිණියෙන් ඉහත සඳහන් පෙත් සම්කාරියගේ 1972 ක්වූ ඔක්තෝබර් මස 19 වැනි දින දරණ දිවුරුම් පත්‍රයද 1972 ක්වූ ඔක්තෝබර් මස 25 වැනි දින දරණ පෙත්සමද කියවා බලා:

මේ නඩුවේ කටයුතු සඳහා ඉහත සඳහන් 4 වෙනි බාල වයස් කාර වගඋත්තරකරුගේ නඩුවේ භාරකරු වශයෙන් තුන්වෙනි වගඋත්තරකරු මෙයින් පත්කරනු ලැබේ.

තවද ඉහත සඳහන් පෙත්සම්කාරිය ඉහත සඳහන් නැසීගිය අයගේ වැන්දඹුව වශයෙන් ඔහුගේ දේපළ පිළිබඳව අද්මිනිස්ත්‍රාසි බල පත්‍රය ලැබීමට ඇය සුදුසු බවත්, ඉහත සඳහන් වගඋත්තර කරුවන් හෝ වුවමනාවක් දක්වන වෙනයම් අයෙක් හෝ අයවලුන් කීප දෙනෙක් හෝ ඊට විරුද්ධ කරුණු මේ උසාවිය සෑහීමට පත් වන අයුරු 1973 ජනවාරි මස 31 වැනි දිනදී හෝ ඊට පෙර ඉදිරිපත් නොකලොත් එකී බලපත්‍රය ඇය වෙත නිකුත් කරන ලෙස මෙයින් නියෝග කරනු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
අතිරේක දිසා විනිසුරු.

එම 1972 ක්වූ ඔක්තෝබර් මස 25 වෙනි දිනදිය.
1-486

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජනවාරි | ... 73. 1. 5 සිකුරාද | ... 72.12.29 සිකුරාද | දවල් 12.00 |
| | 73. 1.12 සිකුරාද | ... 73. 1. 5 සිකුරාද | දවල් 12.00 |
| | 73. 1.19 සිකුරාද | ... 73. 1.12 සිකුරාද | දවල් 12.00 |
| | 73. 1.26 සිකුරාද | ... 73. 1.19 සිකුරාද | දවල් 12.00 |
| පෙබරවාරි | ... 73. 2. 2 සිකුරාද | ... 73. 1.26 සිකුරාද | දවල් 12.00 |
| | 73. 2. 9 සිකුරාද | ... 73. 2.2 සිකුරාද | දවල් 12.00 |
| | 73. 2.15 බ්‍රහස්පතින්ද | ... 73. 2. 9 සිකුරාද | දවල් 12.00 |
| | 73. 2.23 සිකුරාද | ... 73. 2.15 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| මාර්තු | ... 73. 3. 2 සිකුරාද | ... 73. 2.23 සිකුරාද | දවල් 12.00 |
| | 73. 3. 9 සිකුරාද | ... 73. 3. 2 සිකුරාද | දවල් 12.00 |
| | 73. 3.16 සිකුරාද | ... 73. 3. 9 සිකුරාද | දවල් 12.00 |
| | 73. 3.23 සිකුරාද | ... 73. 3.16 සිකුරාද | දවල් 12.00 |
| | 73. 3.30 සිකුරාද | ... 73. 3.23 සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | ... 73. 4. 6 සිකුරාද | ... 73. 3.30 සිකුරාද | දවල් 12.00 |
| | 73. 4.11 බදාද | ... 73. 4. 6 සිකුරාද | දවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්ද | ... 73. 4.11 බදාද | දවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද | ... 73. 4. 19 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.